**ශීර්ෂය 112 - විදේශ අමාත්‍යාංශය**
**-----------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

විදේශ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට විදේශ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) පහත විෂයයන්ගේ වෙනස්කම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බව.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විෂයයන් 3 කට අදාලව ඉකුත් වර්ෂයේ පැවති අගයන් හා ඊට අනුරූප සමාලෝචිත වර්ෂයේ අගයන් අතර එකතුව රු.437,797,441 ක වෙනසක් පැවතුණි. | 2021 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමට උපදෙස් ලබාදී ඇත්තේ මුදල් හා හරස් සටහන් සහිතවයි. එහෙත් 2020 වර්ෂයේ පිළියෙල කර ඇත්තේ මුදල් පදනම මතය. ගිණුම නැවත 2021 උපදෙස් අනුව සකස් කර ඇති නිසා එම වෙනස නිරූපණය වේ. | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය වාර්තාකරන ලද වටිනාකම් වලට අනුරූප වන ලෙස නිවැරදි වටිනාකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |
| (ii) | ඉකුත් වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහනාධාර හා මාරු කිරීම් රු.437,731,433ක් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එවැනි අගයක් දක්වා නොතිබුණු අතර, ඉකුත් වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂයක් නොතිබුණද සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට අදාළව භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂය රු.943,415ක් ලෙස දක්වා තිබුණි. | එම මුදල වර්ගීකරණය සිදුකිරීමේදී ඇතිවූ වරදක් බව පිළිගනිමි. එම මුදල පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම යටතේ දක්වා ඇත. ගිණුම්කරණ චක්‍රලේඛ උපදෙස් පරිදි භාණ්ඩාගාර අක්මුදල් ලැබීම හා විදේශ අමාත්‍යාංශයට පමණක් ලබාදී ඇති පසුගිය වර්ෂයේ අග්‍රිම මාරු කිරීම්ද ඇතුළත්ව ලැබී ඇති අග්‍රිමය ඇතුළත් කර ඇත. ඒ අනුව සංසන්දනාත්මක භාවය පවත්වා ගැනීමට 2021 උපදෙස් පරිදි 2020 ගිණුමද නැවත සකස් කර ඇත. | ඉකුත් වර්ෂයේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළයුතුවීම. |

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් වටිනාකම රු. 8,115,205 ක් වුවත් එම වටිනාකම රු. 8,106,458 ක් ලෙස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ගලපා තිබුණි. | එකඟ වෙමි. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ඇතුළත් කළයුතු වටිනාකම් නිවැරදිව සටහන් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් වටිනාකම රු.304,973 ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එම වටිනාකම රු.313,723 ක් ලෙස ගලපා තිබුණි. | එකඟ වෙමි. | -එම- |

## 1.6.2 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව රු. 2,094,037,896 ක් වූ තැන්පතු ලැබීම් වටිනාකම මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ රු. 2,076,010,925 ක් ලෙස දක්වා තිබීමෙන් තැන්පතු ලැබීම් රු.18,026,971 ක් අඩුවෙන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ගැලපීම් කර තිබුණි. | භාණ්ඩාගාරය ලබාදී ඇති උපදෙස් වන්නේ CIGAS Desktop Trial Balance එකෙහි තැන්පතු ගිණුම් වල ලැබීම් මූල්‍ය කාර්යසාධනයට ගත යුතු බවය. Trial Balance එකේ තැන්පතු ලැබීම් එකතුව වනුයේ රු.2,076,010,925 කි. එය ගිණුම් වලට නිවැරදිව ගලපා ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කළ මාර්ගෝපදේශ අංක 2021/03 අනුව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු. 51,762,773 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව එම වටිනාකම රු. 51,771,520 ක් වූයෙන් අත්තිකාරම් ලැබීම් රු. 8,747 ක් අඩුවෙන් ගලපා තිබුණි. තවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව, අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 39,134,951 ක් වුවද, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ එම වටිනාකම රු. 39,143,701 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් අත්තිකාරම් ගෙවීම් රු.8,750 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගණනය කිරීම් දෝෂයක් සිදුවී ඇති බව පිළිගනිමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ දැක්විය යුතු තැන්පතු ගෙවීම් රු. 2,073,640,054 ක් වුවද, එය රු. 2,050,025,630 ක් ලෙස සටහන් කිරීමෙන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ රු. 23,614,424 ක් අඩුවෙන් ගැලපීම් කර තිබුණි | භාණ්ඩාගාරය මගින් ලබාදී ඇති උපදෙස් වන්නේ CIGAS Desktop Trial Balance එකෙහි තැන්පතු ගිණුම් ගෙවීම් මූල්‍ය කාර්ය සාධනයට ගත යුතු බවය. Trial Balance එකේ තැන්පතු ගෙවීම් එකතුව වනුයේ රු.2,050,025,630 කි. එය ගිණුම් වලට නිවැරදිව ගලපා ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කළ මාර්ගෝපදේශ අංක 2021/03 අනුව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ---------------------- |
| (අ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම රු. 10,837,484,562 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම රු. 11,183,873,316 ක් ලෙස සටහන් කිරීමෙන් රු.346,388,754 ක් වැඩියෙන් ගැලපීම් කර තිබුණි. | භාණ්ඩාගාර උපදෙස් පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනුයේ CIGAS Desktop Trial Balance එකේ සංඛ්‍යා පදනම් කරගෙනය. ඒ අනුව එම වටිනාකම ඇතුලත් කර ඇති බවත් එවැනි වෙනසක් නොමැති බවත් දන්වා සිටිමි. | ඒකාබද්ධ ශේෂ පිරික්සුම පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කළ යුතු වීම. |
| (ආ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව සහනාධාර හා මාරු කිරීම් රු. 470,003,154 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වටිනාකමක් නොමැති ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.470,003,154 ක් අඩුවෙන් ගැලපීම් කර තිබුණි | එම මුදල වර්ගීකරණය සිදුකිරීමේදී ඇතිවූ වරදක් බව පිළිගනිමි. එම මුදල පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම යටතේ දක්වා ඇත. | වර්ගීකරණය නිවැරදිව සිදුකර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කළ යුතු වීම. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ රු. 187,030,142 ක් දක්වා තිබුණද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 63,415,742 ක් වූයෙන් රු. 123,614,400 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අමාත්‍යාංශය දැරූ ප්‍රාග්ධන වියදම් භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදීගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම යටතේ දක්වා ඇත. ඒ අනුව රු.187,030,142 ක් දක්වා ඇති අතර එය භාණ්ඩාගාර උපදෙස් පරිදි Desktop Trial Balance එක හා එකඟවේ. | -එම- |

**1.6.4 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ දූත මණ්ඩල 13 කට අදාල පුනරාවර්තන හා මූලධන ගෙවීම් වවුචර් ගොනු කිහිපයක වටිනාකම් හැර දූත මණ්ඩල 54 ක රු.6,315,346,016 ක පුනරාවර්තන හා රු. 91,171,076 ක මූලධන වියදමට අදාළ ගෙවීම් වවුචර් ගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | රාජ්‍ය තාන්ත්‍රික ගමන් මළු ප්‍රවාහන වියදම් වැඩිවීම නිසා විදේශ දූත මණ්ඩල කිහිපයක වවුචර් ගොනු ගෙන්වීම තාවකාලිකව නවතා තිබුණි. තවද, විදේශ දූත මණ්ඩල කිහිපයක වවුචර් ගොනු මෙරටට ලැබීම ප්‍රමාද වී ඇත. | සියලුම ගෙවීම් වවුචර් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වටිනාකම රු. 55,984,547 ක් වූ නොනිමි ගොඩනැගිලිවල අයිතිය හා පැවැත්ම තහවුරු කිරීමේ ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුර ලබා දී නොමැත. | අයිතිය හා පැවැත්ම තහවුරු කිරීමේ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ඉකුත් වර්ෂ තැන්පතු ලැබීම් වටිනාකම රු.1,452,471,015 ක් හා අත්තිකාරම් ලැබීම් වටිනාකම රු. 43,380,027 ක් වුුවද, එම වටිනාකම් ඉකුත් වර්ෂය සමඟ නොගැලපෙන බැවින් සැසඳුම් ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉකුත් වර්ෂයේ සැසඳුම් ප්‍රකාශ ඉදිරියේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට සටහන්කර ගන්නා ලදී. | තැන්පතු හා අත්තිකාරම් ලැබීම් සැසඳුම් ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඈ) | වටිනාකම රු. 9,730,692,636 ක් වූ කාර්යාල ගොඩනැගිලි, රු. 1,055,280,776 ක් වූ මගී වාහන, රු. 1,010,362,062 ක් වූ මිශ්‍ර නාගරික දේපල හා රු. 317,741,508 ක් වූ නිල නිවාස සම්බන්ධයෙන් හා සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කරන ලද රු.39,119,254 වාහන හා රු. 63,415,740 වත්කම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් එක් එක් වත්කම වෙන්ව හඳුනාගත හැකි පරිදි වූ ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | භාණ්ඩාගාරයේ උපදෙස් අනුව නව CIGAS පද්ධතිය ආරම්භ කිරීමත් සමඟ එක් එක් වත්කමක් වෙන්ව හඳුනා ගත හැකි ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛන පවත්වා නොගන්නා අතර ඒවා නව CIGAS පද්ධතියට ඇතුලත් කර ඇත. | වත්කම වෙන්ව හඳුනාගත හැකි පරිදි ලේඛන පවත්වා ගතයුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **(අ) 7002-0-0-035/13 දරන අග්‍රිම ගිණුම** | | |
| **(i)** 2013 වර්ෂයට හා ඊට පෙර කාල පරිච්ඡේදයන්ට අදාළ අග්‍රිම ගිණුම් ශේෂය ඉකුත් වර්ෂයේදී රු. 91,530,099 ක් වූවද සමාලෝචිත වර්ෂයේදී එය රු. 89,919,237 ක් වී තිබුණු අතර, වර්ෂය තුළ රු.1,610,863 ක් එනම් සියයට 1.7 ක් වැනි සුළු ප්‍රතිශතයක් පමණක් නිරවුල් කර තිබුණි. අග්‍රිම ගිණුමේ රු. 89,919,237 ක් වූ ශේෂය නොපියවූ අත්තිකාරම්වලින් සමන්විත වී තිබුණි. | 2013 වර්ෂයේ නොපියවූ අත්තිකාරම් පියවාගැනිමට එක් එක් දූත මණ්ඩලවලින් අදාළ විස්තර මේ වනවිට ලබාගෙන ඒවා නැවත අයකරගැනීමට අමාත්‍යාංශය කඩිනමින් කටයුතු සිදුකරමින් පවතී. | නොපියවූ අත්තිකාරම් කඩිනමින් අය කර ගැනීමට හෝ විධිමත් අනුමැතියකින් කපා හැරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ii)** විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 248ක් සඳහා ගෙවූ අත්තිකාරම් රු.60,051,898 කින් සමන්විත වී තිබුණි. එම නිවාස ඇප / ආරක්ෂිත තැන්පතු 248 න් රු.478,980 ඇප තැන්පතුව හැර රු. 59,572,918 ක් වූ ඉතිරි නිවාස ඇප තැන්පතු 247 ක්ම මේ වන විට විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු විය. එම තැන්පතු වටිනාකමින් රු. 12,440,021 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබුණු අතර රු. 43,292,731 ක් වර්ෂ 10 ක සිට වර්ෂ 20 ක් අතර පරාසයකද, රු. 3,840,166 ක් වූ ඉතිරිය වර්ෂ 07 ක් ඉක්මවා තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විදේශ දූත මණ්ඩල පාලන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 250 හා 2009 සැප්තැම්බර් 01 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර එම තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ආරක්ෂණ තැන්පතු අයකර ගැනිම සඳහා විදේශ දූත මණ්ඩල වෙත වරින් වර අභ්‍යන්තර චක්‍රලේඛන නිකුත් කරන ලදී. තවද විදේශ දූත මණ්ඩලයන්ගෙන් විමසීම් කර අවශ්‍ය තොරතුරු ලබාගන්නා ලදී. ඒ අනුව එම තැන්පතු නැවත අයකර ගැනීම සඳහා ඉදිරියේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ක්‍රියා කරනු ලැබේ. | විදේශ දූත මණ්ඩල කාර්යය මණ්ඩලය විසින් භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු අය කර ගැනීමට ක්‍රමවේදයක් පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | වටිනාකම රු. 29,867,341 ක් වූ තත් කාර්යය අතුරු අග්‍රිම 127 ක් පැවති අතර ඉන් රු. 699,358 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබූ අතර, රු. 12,840,889 ක් වර්ෂ 10 ක සිට වර්ෂ 20 ක් අතර පරාසයක හා ඉතිරි රු. 16,327,094 ක් වර්ෂ 07 ඉක්මවා තිබුණි. මු.රෙ. 371 ප්‍රකාරව තත් කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද මෙම අත්තිකාරම් 72 ක් කුමන කරුණක් සඳහා ලබා දී ඇතිද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වුණි. | ඇතැම් තත්කාර්යයන් සඳහා ලබාදෙන ලද අතුරු අග්‍රිම පෙර වර්ෂයන්හීදී නිසි පරිදි අයකරගැනීමට කටයුතු සිදුකරලීමට නොහැකිවුවද, ඉදිරියේදී එවැනි තත්කාර්යය අතුරු අග්‍රිම නිසි පරිදි එම කාර්යයන් අවසානයේ පියවා ගැනීමට කටයුතු කරන බව. | කාර්යය නිම කළ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වීම. |

**(ආ) 7002-0-0-035/21 දරන අග්‍රිම ගිණුම**
**---------------------------------------**

| | | | |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ අග්‍රිම ගිණුම් ශේෂය තුළ රු.344,210,756 ක් විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු වී තිබුණි. එම ආරක්ෂිත තැන්පතු වලින් රු. 19,536,652 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 46 කට අදාළ වී තිබුණි. එම වටිනාකමින් රු. 3,020,376 ක් වර්ෂ 10 ඉක්ම වූ තැන්පතු වටිනාකම් වී තිබූ අතර රු. 16,516,276 ක් වර්ෂ 04 ත් වර්ෂ 10 ත් අතර කාල පරාසයක් ගත වී තිබූ තැන්පතු විය. | ඇතැම් අවස්ථාවන්හි දී දූත මණ්ඩල සඳහා අළුතින් පැමිණෙන නිළධාරීන්ට එකී නිවාස භාරදීම හා එම අත්තිකාරම් ආරක්ෂණ තැන්පතු ලෙස පවත්වාගෙන යනු ලබන නිසාත්, මුල් අවස්ථාවේ දී ගෙවන අත්තිකාරම් පියවාගැනීමට අවම වශයෙන් වසර 03 සිට වසර 20 කට වැඩි කාලයක් ගතවී ඇති බව පෙන්වා දෙනු ලැබේ. තවද, පදිංචියෙන් ඉවත්ව ඇති නිවාස වල නොපියවූ අත්තිකාරම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බවට සඳහන් කරමි. | විදේශ දූත මණ්ඩල නිලධාරීන්ගේ සේවය අවසන් වන අවස්ථාවේදී නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු අය කර ගැනීමට ක්‍රමවේදයක් පිළියෙල කළ යුතු වීම. |
| **(ii)** | දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් තුළ රු. 21,024,362 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම වූ අතර ඒ තුළ 2018 වර්ෂයට පෙර කාලයට අදාළ රු. 3,931,910 ක් ද 2019 වර්ෂයට අදාළ රු.2,433,646 ක් හා 2020 වර්ෂයට අදාළ රු.4,272,499 ක් ද විය. එම තත්කාර්යය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් මු.රෙ. 371 හි සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී එවැනි තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යයන් අවසානයේ නිසි පරිදි අයකරගැනීමට විදේශ දූත මණ්ඩල වෙත චක්‍රලේඛන මගින් උපදෙස් ලබාදීමට දැනටමත් කටයුතු කර ඇත. | කාර්යය නිම කළ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැය විෂයන් 28 ක් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 51ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් මුළු වටිනාකම රු.561,669,027 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි. | රු. 561,669,027 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය සිදු වී ඇති බවට එකඟ වෙමි.<br>භාණ්ඩාගාරය විසින් දෙන ලද උපදෙස් අනුව කටයුතු කිරීමට සිදුවීම සහ කොරෝනා වසංගතය මත සිදු වූ බලපෑම නිසා අපේක්ෂිත වියදම් ඇතිනොවීමට හේතු වූ බව දන්වමි. | මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කළ යුතු වීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති සටහන් අංක iii යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය (SA - 92) සමඟ සැසඳී තිබිය යුතු වුවද බැඳීම් හා බැරකම් ප්‍රකාශ සටහන් අංක iii යටතේ<br>රු. 115,320,800 ක් දක්වා තිබූ අතර SA – 92 අනුව එම ශේෂය රු. 250,194,868 ක් විය. | අමාත්‍යාංශයේ බැරකම් සහ බැදීම් වලට අදාල තොරතුරු නිවැරදිව ලබාගත හැකි වුවත්, විදේශ දූත මණ්ඩල වලින් බැරකම් සහ බැදීම් වලට අදාල තොරතුරු එදිනට ලබා ගැනීමේ අපහසුතාවයක් පවතී. එබැවින් අදාල ආකෘති 02 ක අතර සැසඳීමක් නොවන බව දන්වමි. මේ සම්බන්ධයෙන් විදේශ දූත මණ්ඩලවල අදාල සියළුම නිලධාරීන් දැනුවත් කිරීමටත් ඉදිරියේදී මෙවැනි දෝෂයන් ඇති නොවීමට කටයුතු කරන බව.<br>. | සටහන් අංක iii යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය (SA - 92) සමඟ සැසඳී තිබිය යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ** xix පරිච්ඡේදයේ 8.1, 8.2 වගන්තීන් | රජයේ නිවාසවල විදුලි උපකරණ පිළිබඳ ඉන්වෙන්ට්‍රියක්ද, නිවාසයේ නඩත්තුව පිළිබඳ වගකීම පැවරී ඇති බලධරයන් අනෙකුත් උපකරණ හා සවිකිරීම් යනාදිය පිළිබඳ ඉන්වෙන්ට්‍රියක්ද තබා ගත යුතු වුවත් විදේශ අමාත්‍යාංශයේ රජයේ නිවාස 27 කට අදාළව එවැනි ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිල නිවාස සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කර ඇතත් යාවත්කාලීන කර නොතිබුණි. එහෙත් මේ වනවිට ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. | අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i).** | මුදල් රෙගුලාසි 104(1) | වර්ෂ 01ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණු රු. 3,990,669 ක් වූ වාහන අනතුරු 13ක් සම්බන්ධයෙන් හා 2010 වර්ෂයේදී සිදුව තිබූ රු. 1,991,695 ක් වූ වාහන සොරකම් කිරීම් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද පාඩුවක් හෝ අලාභයක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්වය වශයෙන් දැන ගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්වය කිරීම සඳහාත් පරීක්ෂණ | අවශ්‍ය පියවර ඉක්මණින් ගැනීමට කටයුතු කර, ඉදිරියේදී ඒ බව දැනුම් දීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | පැවැත්විය යුතු වුවත් වර්ෂ 01ක සිට වර්ෂ 05ක් දක්වා කාල පරාසයක් තුළ විදේශ දූත මණ්ඩල 05 කට අදාළව රු. 403,777 ක භාණ්ඩ නැතිවීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| **(ii).** | මුදල් රෙගුලාසි 106 | වර්ෂ 09ක සිට වර්ෂ 15ක් දක්වා කාල පරාසයක් තුළ විදේශ දූත මණ්ඩල 5 කට අදාලව මුදල් නැතිවීම් රු. 17,201,664 කින් රු.16,141,919 ක් සම්බන්ධයෙන් ගත් නෛතික ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණු අතර ඉතිරිය සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් සොරකම පිලිබද කොලඹ මහාධිකරණයේ නඩු දෙකක් පවරා ඇති අතර මේ වනවිට සාක්ෂි විමසීම් අවසන් අදියරේ පවතී. අනෙකුත් හානි සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතුකර ඇත. | නැතිවූ මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 106 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(iii).** | මුදල් රෙගුලාසි 371(5) | අතුරු අග්‍රිමයන් එය දෙන කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් විදේශ දූත මණ්ඩල 12 කට අදාළව දෙන ලද නොපියවූ අත්තිකාරම් එකතුව රු. 1,804,674 ක් වර්ෂ 7 ක සිට වර්ෂ 28 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි. | ඉදිරියේදී එවැනි තත්කාර්යය අතුරු අග්‍රිම නිසි පරිදි එම කාර්යයන් අවසානයේ අයකර ගැනීමට විදේශ දූතමණ්ඩල වෙත චක්‍රලේඛන මගින් උපදෙස් ලබාදීමට දැනටමත් කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකල විගසම අග්‍රිම පියවිය යුතු වීම. |
| **(iv).** | මුදල් රෙගුලාසි 565(5) | එක් එක් මාසය සඳහා පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දූත මණ්ඩලවලට අදාල යාවත්කාලීන කිරීම් කරනු ලබන්නේ මාසික ගිණුම් සාරාංශ සහ එක් එක් දූත මණ්ඩලයෙන් ලැබෙන ගිණුම් වාර්තා ලැබීමෙන් පසුව බව දැනුම් දෙමි. | රෙගුලාසි ප්‍රකාරව එක් එක් මාසය සඳහා මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| **(v).** | මුදල් රෙගුලාසි 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් යනතුරුත් හිමිකම් නොපාන ලද තැන්පතු රාජ්‍ය ආදායමට ගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් රු. 32,601,682 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වසර දෙක ඉක්මවූ තැන්පතු ත්‍රෛමාසිකව විශ්ලේෂණය කර රජයේ ආදායමට බැර කිරීම සිදු කරනු ලබන බව දන්වා සිටිමි. | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඇ)** | 2015 ඔක්තෝම්බර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් දෙපාර්තුමේන්තු චක්‍රලේඛයෙහි 4.3 (ඉ) (i) හා (ii) | චක්‍රලේඛය ප්‍රකාරව කල් ඉකුත් වූ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද එපරිදි අයකර නොගත් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන හඳුනා නොගත් රු. 1,499,176 ක ණය ශේෂයක් පැවතුණි. | මිය ගිය / විශ්‍රාම ගිය / වැඩ තහනම් කළ / සේවය හැර ගිය නිලධාරීන් ගේ පුද්ගලික ලිපිගොනු හා ණය ලිපිගොනු පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු කිරීම සඳහා සටහන් කර ගතිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කල් ඉකුත් වූ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඇ)** | 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විශ්‍රාම ගනු ලබන හා මිය ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් කඩිනමින් පියවිය යුතු වුවත් මිය ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු. 465,050 ක ණය ශේෂයක් පැවති අතර ඉන් රු. 273,560 ක ණය ශේෂයක් වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවතුණි. | -එම- | -එම- |
| **(ඉ)** | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ | අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි. | පවතින අඩුපාඩු නිවැරදි කර ප්‍රසම්පාදන සැලැස්ම නිසි පරිදි සකස් කර ක්‍රියාත්මක කිරීමට අදාල අංශ දැනුවත් කර ඇත. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතු වීම. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ)** | අත්තිකාරම් "බී" ගිණුම් වාර්ෂික සැසඳුම් ප්‍රකාශයට අනුව නිලධාරින් 24 දෙනෙකුගෙන් වැඩිපුර අය කරගන්නා ලද රු. 215,322 ක ශේෂයක් පැවති අතර එම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කාල වකවානුව තුල ඉතා කඩිනමින් අදාල නිලධාරීන්ට වැඩිපුර අයවී ඇති මුදල් නැවත ගෙවීමට කටයුතු කරමින් පවතී. | වැඩිපුර අය කරගන්නා ලද ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ආ)** | සේවය හැර ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු. 1,098,606 ක ශේෂයක් අයවිය යුතුව පවතින අතර එම ණය ශේෂය තුළ වර්ෂ 2 ත් වර්ෂ 3 ත් අතර ශේෂය රු. 435,660 ක්ද, වර්ෂ 4 ත් වර්ෂ 5 ත් අතර ශේෂය රු. 127,275 ක් සහ වර්ෂ 5ට වැඩි ණය ශේෂය රු. 535,671 ක් ලෙසද පැවතුණි. | සේවය හැර ගොස් ඇති නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනු හා ණය ලිපිගොනු පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු කිරීම සඳහා සටහන් කර ගතිමි. | සේවය හැර ගොස් ඇති නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඇ)** | සේවය අවසන් කළ නිලධාරීන් 5 දෙනෙකුට අදාළව රු. 299,955 ක ණය ශේෂයක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවය අවසන් කළ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා කටයුතු කිරීමට සටහන් කරගතිමි. | සේවය අවසන් කළ නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඈ)** | වැඩ තහනම් කළ නිලධාරීන් දෙනෙකුගෙන් රු.130,551 ක මුදලක් අයවිය යුතුව පැවති අතර එම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | වැඩ තහනම් කළ නිලධාරීන් ගේ පුද්ගලික ලිපිගොනු හා ණය ලිපිගොනු පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු කිරීම සඳහා සටහන් කර ගතිමි. | වැඩ තහනම් කළ නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කැන්බරා දූත මණ්ඩලයෙහි ඕ. ඩො 402 ක් වටිනා චෙක්පත් 03 ක් සහ බර්ලින් දූත මණ්ඩලයෙහි යුරෝ 110 ක් වටිනා චෙක්පතක්ද 2010 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරාසය තුළ තැන්පත් කළ නමුත් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි. | උපලබ්ධි නොවූ චෙක්පත් කඩිනමින් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි. | උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කළ යුතු වීම. |
| (ආ) ලොස්ඇන්ජලිස් දූත මණ්ඩලයෙහි 2011 වර්ෂයේදී සොරකම් කරන ලද ඇ. ඩො 1583 ක් සහ මොස්කව් දූත මණ්ඩලයෙහි 2002 වර්ෂයේදී හා 2003 වර්ෂයන්හිදී තැන්පත් නොකරන ලද මුදල් ලෙස ඇ.ඩො 155 ක් බැංකු සැසඳුම් ප්‍රකාශන තුළ පැවතියද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලොස් ඇන්ජලීස් දූත මණ්ඩලයෙහි සොරකම් කරන ලද මුදල් පිලිබඳ සොයාබලා හැකි ඉක්මණින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. මොස්කව් දූත මණ්ඩලයෙහි මෙම මුදල ගිණුම්කරණයේදී ඇති වූ දෝෂයක් බැවින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | සොරකම් කරන ලද හා තැන්පත් නොකරන ලද මුදල් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශන තුළ පවතින ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් මහජනතාවට සලසනු ලබන සේවාවන් වන අ.පො.ස (සා/පෙ.), අ.පො.ස (උ/පෙ.) විභාග සහතික සහ උප්පැන්න, විවාහ, මරණ සහතික කාර්යක්ෂමව | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීමේ තාක්ෂණික සාකච්ඡා අවසන් අදියරේ පවතින අතර, විභාග දෙපාර්තමේන්තුවේ | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරකම් නිවැරදිව සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සත්‍යාපනය කිරීම පහසු කිරීම සඳහා විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e - DAS) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීමට සැලසුම් කර තිබුණද වාර්තාවේ දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි. | තාක්ෂණික සාකච්ඡා මේ වනවිට අවසන් වී ඇත. එසේ වුවද, විද්‍යුත් ලේඛණ සහතික කිරීමේ පද්ධතියේ (e-DAS) පසුගිය වසර තුල වරින් වර ඇතිවූ තාක්ෂණික දෝෂ හේතුවෙන් පද්ධතිය අපේක්ෂිත ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවුනි. | |
| **(ආ)** | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි අමාත්‍යාංශයේ කන්සියුලර් අංශය මඟින් සපයන සේවාවන් සඳහා අය කරන ගාස්තු සංශෝධනය කර ගැසට් පත්‍රයක් පළ කිරීමට සැලසුම් කර තිබුණද එය ඉටු කර නොතිබුණි. | කොරෝනා තත්ත්වය යටතේ අමාත්‍යාංශයේ කටයුතු විවිධ සංවරණ සීමා යටතේ පවත්වාගෙන යාමට සිදුවීමත්, එවකට විදේශ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයන්ගේ රැකියා අහිමිවීම, අවතැන්වීම,ගුවන් ටිකට්පත් ඉහළ යාම හා එම රටවල ජීවන වියදම් ද ඉහළ යාම නිසා කොන්සියුලර් ගාස්තු ඉහළ නැංවීම ශ්‍රී ලාංකිකයන්ට තවත් එක් පීඩාකාරී තත්ත්වයක් ඇතිවීම යන කරුණු පිළිබඳව සළකා බලා කොන්සියුලර් ගාස්තු සංශෝධනය කිරීම කල් දැමූවද, ගාස්තු සංශෝධනයට අදාල කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී. | කොන්සියුලර් ගාස්තු සංශෝධනය කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

**3.2 වත්කම් කළමනාකරණය**

**---------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ------------------------- | -------------------------------- | ------------ |
| අමාත්‍යාංශය විසින් කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 20 ක් මිලදී ගැනීම වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත රු. 70,638,545 ක මුදලක් ගෙවා තිබුණද ඉන් නිවාස ඒකක 17 ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගැනීමට විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | නිරන්තරයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත් මේ දක්වා සාර්ථක ප්‍රතිචාරයක් ලැබී නොමැත. | හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 පාඩු හා හානි**

--------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වැඩසටහන් අංක 02 යටතේ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලයන්හි සිද්ධීන් 55 කට අදාළව තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති රු. 29,185,385 ක පාඩු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ කාල විශ්ලේෂණය අනුව එම වටිනාකමින් රු.2,254,421 ක් වර්ෂ 10 ක් ඉක්මවා තිබුණු අතර රු.21,626,285 ක් වර්ෂ 05 ක සිට වර්ෂ 10 ත් අතර කාල පරාසයක පවතින බව නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කරගන්නා ලදී. | පරික්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** විදේශ දූත මණ්ඩල පවතින ඕස්ට්‍රේලියාව, ස්වීඩනය හා කෙන්යාව යන රටවල ශ්‍රී ලංකා රජයට අයත් ගොඩනැගිලි පැවතියද ඒවා ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ වත්කම් ප්‍රශස්ථ අන්දමින් පරිහරණය කිරීමට විදේශ දූත මණ්ඩල වෙත උපදෙස් චක්‍රලේඛ නිකුත් කර ඇති අතර, අවශ්‍ය පරිදි ඉදිරියේදී නැවත උපදෙස් නිකුත් කිරීමටත් පසු විපරම් කිරීමටත් බලාපොරොත්තු වේ. | වත්කම් ප්‍රශස්ථ අන්දමින් උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විදේශ තානාපති කාර්යාල සඳහා කාර්යය මණ්ඩල පත් කිරීමේදී එක් එක් රටවල් අනුව අදාළ කර ගන්නා විධිමත් නිර්ණායක විශ්ලේෂණය කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2018 අගෝස්තු මස 07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග අංක 07 මඟින් නියම කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල සඳහා කාර්යය මණ්ඩල පත්කිරීමේදී ඇතුලත් කරගන්නා නිර්ණායක ඇතුලත් වාර්තාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග එක්ව ලබාදෙන ලෙසට නියෝග කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් සකස් කල වාර්තාව නිරීක්ෂණ සඳහා 2019 මැයි 16 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇත. | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද්වීතියික මට්ටමට අයත් අනුමත සේවක සංඛ්‍යාව 369 තුළ ඇතුළත් සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සේවා නිලධාරීන් පිළිවෙලින් 74ක් හා 169 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 86 ක් හා 207 ක් වූයෙන් අතිරික්තය 12 ක් හා 38 ක් විය. | 2019 වර්ෂයේ බඳවාගෙන ඇති උපාධිධාරී අභ්‍යාසලාභීන්, සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමේදී අනුයුක්ත කර ඇති සියලුම නිලධාරීන්ට රාජකාරී භාර ගැනීමට අවස්ථාව සලසාදෙන ලෙසත්, කිසිදු නිලධාරියෙකු අතිරික්ත නිලධාරීන් ලෙස සලකා කටයුතු නොකරන ලෙසත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් උපදෙස් ලැබී ඇත. ඒ අනුව බඳවා ගැනීම් කටයුතු අවසන් වූ පසු නව තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.<br>විදේශ දූත මණ්ඩල සේවය අවසන් කර කළමනාකරණ සේවා නිලධාරීන් විදේශ අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම හේතුවෙන් එම කාර්යය මණ්ඩලයේ අතිරික්තයක් ලෙස පෙන්නුම් කෙරේ. වාර්ෂික ස්ථාන මාරුවීම් තුලින් එම අතිරික්ත කාර්යය මණ්ඩලය කලමනාකරණය කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ xiii වැනි පරිච්ඡේදයේ 154 වගන්තිය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක් නැවත රජයේ සේවයෙහි යෙදවීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පමණක් පැවරෙන බවත් එහි 157 වගන්තිය අනුව රජයේ සේවයෙන් විශ්‍රාම ලත් තැනැත්තෙක් නැවත සේවයේ යෙදවිය හැක්කේ කොන්ත්‍රාත් පදනම මත පමණක් වන බවත් එවැනි පත්කිරීමක් එක් අවස්ථාවකදී එක් අවුරුද්දක කාල පරිච්ඡේදයකට සීමා කළ යුතු වුවද ටොරෙන්ටෝ විදේශ දූත මණ්ඩලයේ සියරට පේරුවේ පෞද්ගලික සහකාර තනතුර සඳහා 2019 අගෝස්තු 28 දින විශ්‍රාම ලත් නිලධාරිනියක 2019 සැප්තැම්බර් 01 දින සිට වසර 03 ක කාලයක් බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව පත් කර තිබුණි. | සේවයෙන් විශ්‍රාම ගත් අර්ධ රාජ්‍ය සේවයේ එකී නිලධාරිණිය තනතුරට පත්කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගෙන එකී පත් කිරීම් සිදු කිරීමට ඇවැසි පූර්ව අවශ්‍යතාවය අනාවරණය වුවායින් පසු ප්‍රස්තුත පත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතිය ඉල්ලා ඇත.<br>ඉදිරියේදී මෙවැනි පත් කිරීම් සිදු කිරීමේදී, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අවශ්‍ය පූර්ව අනුමැතියන් ලබා ගැනීමට කටයුතු කිරීමට මෙම අමාත්‍යාංශය විසින් පියවර ගනු ඇත. | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |